# හින්දු ආගමේ විකාශය

භාරතයට බටහිරින් පැමිණි ආර්යයන් භාරතයේ තිබූ ප්‍රාග් වෛදික සංස්කෘතියට වෙනස් සංස්කෘතියක් හා චින්තනයක් සමග පැමිණ ඇති බව පැහැදිලි ය. ආර්යයන් යුද්ධයෙහි දක්ෂයන් වූ බැවින් ඔවුන්ට ප්‍රාග් වෛදිකයන් පරදවා මුල දී තම සංස්කෘතිය භාරතයේ සිටි ජනයා මත පැටවීමට බාධාවක් නො වී ය. එබැවින් ආර්යයන් විසින් ගෙනෙනු ලැබූ යාග හෝම බලි බිලි සහිත සංස්කෘතිය, වෛදික සංස්කෘතියේ ප්‍රධාන සංරචකය බවට පත්වී යැයි සිතිය හැකි ය. ආර්යයන් භාරතයට ඒක දේවවාදය ද ගෙන එන්නට ඇතැයි සිතිය හැකි ය. බ්‍රහ්මන් යනු ඒ එක් දෙවියා වෛදික සංස්කෘතියෙහි මුල් බැසගත් ආකාරය යැයි විශ්වාස කළ හැකි ය.

එමෙන් ම වියුක්ත ප්‍රවාද ගොඩනැගීම ද වෛදික සංස්කෘතියට ඇතුළත්කරන්නට ඇත්තේ ආර්යයන් යැයි සිතිය හැකි ය. කුල ක්‍රමය හෙවත් වර්ණ භේදය භාරතයට හා වෛදික සංස්කෘතියට ඇතුළත් කෙළේ ආර්යයන් බව කවුරුත් පිළිගනිති. ඒ කුල ක්‍රමයේ බ්‍රාහ්මණයෝ වියුක්ත ප්‍රවාද ගොඩනැගූ අතර දැනුම් ආධිපත්‍යය ද අත්කරගත්හ. බ්‍රාහ්මණයන්ට පෙර භාරතයේ වියුක්ත ප්‍රවාද ගොඩනැගුවන් ගැන සඳහනක් නැත. භාවනා හා ධ්‍යාන ගැන දැනීමක් නොතිබූ බමුණෝ භාරතයට දැනුම ලබාගැනීමේ වෙනත් ක්‍රම හඳුන්වා දෙන්නට ඇත.

එසේ වුව ද ප්‍රාග් ඓතිහාසික සංස්කෘතියෙහි අංග භාරතයෙන් මුළුමනින් ම මැකී ගියේ නැත. භාවනා, ධ්‍යාන වැඩීම හා යෝග ක්‍රම ඔවුන් අතර විය. ආර්යයන් භාරතයට පැමිණීමට පෙර දැනුම ලබාගැනීමේ (නිර්මානයකිරීමේ) ප්‍රධාන ම මාර්ගය වන්නට ඇත්තේ ප්‍රත්‍යක්ෂය යැයි සිතීමට හැකි ය. මනස හා අනෙක් ඉන්ද්‍රිය ඇසුරෙන් අපි ප්‍රත්‍යක්ෂ කරමු. මනස භාවනා, යෝග හා ධ්‍යාන ඔස්සේ වැඩි දියුණු කළහොත් සාමාන්‍ය මනසට දැකිය නොහැකි දැනුමක් ද ලබාගැනීමේ හැකියාව වෙයි. බෞද්ධයන් අතර ඇති දැනුමෙහි පංචාභිඥා උපදවා ඒ මගින් ලබාගන්නා වූ අත්දැකීම් ගැන ද කියැවෙයි. එලෙස පංචභිඥා ඔස්සේ ලබන දැනුම ද ප්‍රත්‍යක්ෂ ගණයට අයත්වන බව අමතක නොකළ යුතු ය.

බ්‍රහ්මණයන් මුල දී ධ්‍යාන හා යෝග ක්‍රම බැහැර කළ බවට සැකයක් නැත. ඇතැම් උගතුන්ට අනුව ප්‍රාග් වෛදිකයන් දැනුම ලබාගැනීමේ ධ්‍යාන නොවන ක්‍රම අනුගමනය කළ බ්‍රාහ්මණයන්ට අවඥාකිරීම සඳහා අධ්‍යායනිකයන් යන පදය යොදාගෙන ඇත. අද අප මහත් අභිරුචියෙන් යොදාගන්නා වචනයක් වූ අධ්‍යයනකිරීම යන්න එදා අවඥාවෙන් යෙදුවක් විය. පසුකලෙක බමුණන් අධ්‍යායනික යන්නෙහි අවඥාවෙන් මිදීම සඳහා අධ්‍යායන යන්න අධ්‍යයන වශයෙන් යොදගෙන අධ්‍යයන යන්නට වෙනත් අර්ථකථන දී ඇති බව පැහැදිලි ය. අධ්‍යයන යන්න අධි උපසර්ගය හා අයන යන්න එකතුවෙන් සැදුණු වචනයක් යැයි අද ද බමුණන් විසින් දෙනලද අර්ථකථනය යොදාගන්නෝ කියති. අයන යන්නෙන් ඉහළ, උසස් යන්න ගම්‍ය වන බැවින් අධ්‍යයන හෙවත් අධි අයන යන්නේ ඉතා උසස් තත්ත්වයක් අත්කරගැනීමක් වැනි අදහසක් කියැවෙන්නේ යැයි ඔවුහු ප්‍රකාශකරති. බමුණන්ට දැනුම් ආධිපත්‍යය ලැබුණු පසු තමන්ගේ ක්‍රමයට අවඥාකිරීම සඳහා යොදාගත් පදයක් ම වෙනත් අර්ථකථනයක් ඔස්සේ වාසිදායක තත්ත්වයකට පත්කරගත් අයුරු ඉන් දැක්වෙයි.

වෛදික සංස්කෘතිය ආරම්භයෙහි දී ආර්යයන් යුද්ධ ශක්තිය යොදවා ප්‍රාග් වෛදික සංස්කෘතිය පසුබැස්සවූ ද, ප්‍රාග් වෛදික සංස්කෘතියෙහි ශක්තිය ක්‍රමයෙන් බමුණන්ට ද වැටහෙන්නට විය. එහි ප්‍රතිඵලය වූයේ බමුණන් ද ප්‍රාග් වෛදික ක්‍රම හැදෑරීම ය. ඇතැම් බමුණන් අනෙක් බමුණන්ට හොරෙන් ප්‍රාග් වෛදික ක්‍රම හැදෑරූ බව පෙනෙයි. ඒ සඳහා ඇතැම් විට වෙනත් ආරණ්‍යකයන් සමග ඔවුන් ද ආරණ්‍ය වාසයට යන්නට ඇත. කෙසේ හෝ බොහෝ උගතුන්ගේ පිළිගැනීම වන්නේ වෛදික සංස්කෘතියෙහි ආරණ්‍යක යුගයේ ග්‍රන්ථවල ප්‍රාග් වෛදික මතිමතාන්තර දැකගත හැකි බව ය. මෙයින් කියැවෙන්නේ මුල් යුගයේ දී යුද්ධ ශක්තියෙන් ආර්යයන් ප්‍රාග් වෛදික සංස්කෘතිය පසුබැස්සවූ නමුත් ඒ පසුබස්සවන ලද සංස්කෘතියෙහි ශක්තිය හේතුකොටගෙන ඉන් පසු කාලයක දී වෛදික සංස්කෘතියට තව තවත් ප්‍රාග් වෛදික සංරචක ඇතුළත් වී ඇති බව ය.

අප කලින් ද කියා ඇති පරිදි බුදු දහම ඇතිවූයේ භාරතයේ අර්ධ වෛදික සමාජයක ය. එමෙන් ම ජෛන ආගමට ද අර්ධ වෛදික බලපෑම් විය. එහි එක් ප්‍රතිඵලයක් වූයේ බුදු දහමෙහි මෙන් ම ජෛනාගමෙහි ද අවිහිංසාව වෛදික

සංස්කෘතියට ක්‍රමයෙන් ඇතුළත් වීම ය. ආරණ්‍යයක අවධියෙහි වෛදික සංස්කෘතියට ප්‍රාග් වෛදික දැනුම ලබාගැනීමේ මාර්ග එකතුවීමෙන් පසුව වෛදික ආගමට ප්‍රාග් වෛදික ආගම්වල (දහම්වල) ඇතැම් කරුණු ද එකතු විය. එසේ එකතුවකින් නිර්මිත වූ හින්දු ආගම සතුන් බිලි දීම අත්හැර අවිහිංසා මාර්ගයක ගමන්කිරීමට පටන්ගත්තේ ය. මෙලෙස වෛදික, බෞද්ධ හා ජෛන ආගම් සංකලනයෙන් බිහි වූ හින්දු ආගම බුදු දහමට පෙර තිබිණි යැයි කීම කිසිසේත් ම තාර්කික නො වෙයි. එබැවින් සිදුහත් කුමරු හින්දුවරයකු ව ඉපදුණි යැයි කීම වැරදි ය.

හින්දු යන නමේ ප්‍රභවය පිළිබඳව ද විවිධ මතිමතාන්තර වෙයි. ඉන් එක් මතයක් වනුයේ භාරතයට වයඹ දිගින් පැමිණියවුන් සින්ධු ගඟෙන් අනෙක් පැත්තේ සිටි ජනතාව සින්ධුන් ලෙස හැඳින්වූ බව හා උච්චාරණයේ දී ඇති වූ අපහසුකම් මැද සින්ධු යන්න පසුකලෙක හින්දු වූ බවත් ය. එහෙත් පසුගියදා මම කියවීමට ලැබුණු ලිපියක එයට විරුද්ධ මතයක් සඳහන් වෙයි. ඒ අනුව හින්දු යනු කළු නම් අර්ථය ගෙන දෙන්නකි. ඒ ලිපියෙහි සඳහන් ආකාරයට භාරතයට පැමිණි ආර්යයෝ කළු පැහැති ස්වදේශිකයන් හැඳින්වීම සඳහා හින්දු යන නම යොදාගත්හ. ලිපියේ කතෘවරයාට අනුව හින්දුකුෂ් කඳුවැටියට ඒ නම ලැබත ඇත්තේ කළු මිනිසුන් මරණයට පත්කරන ලද ස්ථානය යන යන අරුතින් ය.

ඒ කෙසේ වෙතත් හින්දු යන පදය භාරතයේ විසූ ස්වදේශිකයන් හැඳින්වීම සඳහා වයඹින් භාරතයට පැමිණි ආර්යයන් යොදාගත් එකක් විය යුතු ය. එහෙත් මුල දී ඉහත සඳහන් පරිදි හින්දු ආගමක් යනුවෙන් ආගමක් නො වී ය. ආර්යයන් මුල දී භාරතීය ස්වදේශිකයන් සමග එකතු වී වෛදික ආගම (දහම) නිර්මානය කරන්නට ඇත. කල් යෑමේ දී වෛදික දහමට බ්‍රාහ්මන යුගයේ දී ධ්‍යාන හා යෝග ද පසුකලෙක බෞද්ධ හා ජෛන දහම්වල කොටස් එකතු වී ඇත. මේ සංයුක්ත හින්දු දහම හින්දු ආගම ලෙස නම්කර ඇත්තේ යුරෝපීයයන් විසින් ය.

බටහිරයන් භාරතයට ඒමට පෙර ආගම් වශයෙන් කිවහැකි පද්ධතීන් දකුණු ආසියාවේ හා නැගෙනහිර ආසියාවේ තිබිණි යැයි සිතිය නො හැකි ය. එහි තිබුණේ ජීවන ක්‍රම ය. ඒ ජීවන ක්‍රම සමග බැඳුණු දහමක් විය. ලංකාවේ ද පැවතියේ සිංහල බුදු සසුනක් මිස බුද්ධාගමක් නො වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ ඒ දහම් පදනම් කරගත් ජීවන රටාවන්හි ආගමික කරුණු නොතිබිණි ය යන්න නො වෙයි. ආගම යන්න බටහිර සංකල්පයකි. ඒ බටහිර සංකල්පයෙන් කියැවෙන ප්‍රපංචයෙහි ඇතැම් ලක්ෂණ පෙරදිග ජීවනක්‍රමවල ද තිබුණි. ඒ ජීවන ක්‍රම ආගම් බවට නම්කරනු ලැබුයේ යුරෝපීයයන් විසින් ය. භාරතයේ තිබූ හින්දු ජීවන ක්‍රමයත් ලංකාවේ තිබූ බුදු සසුනත් පිළිවෙළින් හින්දු ආගමත් බුද්ධාගමත් බවට පත්කෙරිණි.

මේ සියල්ලෙන් කියැවෙන්නේ අද වෛදික ආගම නමින් හැඳින්වෙන වෛදික දහම ක්‍රමයෙන් ප්‍රාග් වෛදික යෝග, භාවනා, බුදු දහම හා ජෛන දහම මුසුකර ගනිමින් හින්දු දහම හෙවත් හින්දු ජීවන ක්‍රමය බවට පත්වූ බවත් පසුව ඒ හින්දු ආගම ලෙස නම් කෙරුණු බවත් ය. මේ විකාශය අතරට එක්වන තැනැත්තන් දෙදෙනා නම් නාගර්ජුනපාදයන් වහන්සේ හා ශංකරාචාර්යතුමා ය. කලින් සඳහන් කළ ආකාරයට නාගර්ජුනපාදයන් වහනසේ බුදු දහමට පටහැණි ශූන්‍යතාවාදයක් නිර්මානය කළහ. උන්වහන්සේගේ ශූන්‍යතාවාදයෙහි නිවනට ඔබ්බෙන් වූ ශූන්‍යත්වයක් විය. ඒ ශූන්‍යතාවෙන් කියැවුනේ ලෝකය සංකල්පීය වශයෙන් ගත්කල ශූන්‍ය බව පමණක් නො වේ . ශූන්‍යත්වයක් වේය යන්න ද ඉන් කියැවිණි.

ශූන්‍යත්වයට ගුණ නැත. එය ඉන්ද්‍රිය ගෝචර නො වෙයි. ඉන්ද්‍රිය ඔස්සේ ශූන්‍යත්වය දැකිය නො හැකි ය. එයට සාපේක්ෂක ව විරුද්ධයක් නැත. නාගර්ජුනපාදයන් වහන්සේගේ පද්ධතියෙහි අඳුර-එළිය, සසර-නිවන ආදී වශයෙන් ද්විමය විරුද්ධයන් සාපේක්ෂව ගන්නා නමුත් ශූන්‍යතාව ඒ ආකාරයෙන් ද්විමය විරුද්ධයක එක් කොටසක් ලෙස නො ගැනෙයි. මේ දැනුම භාරතීය වියුක්ත සම්ප්‍රදායෙහි නිර්මානය වුවක් නමුදු භාරතීය මනසට එය පමණට වඩා වියුක්ත විය. භාරතීයන්ට අවශ්‍ය වන්නේ වියුක්තය වුව ද යම් ආකාරයකට හෝ සංයුක්තව, අඩුම තරමින් දියුණුකරන ලද මනසකින් විඳීමට ය. ශූන්‍යතාව එසේ මනසින් විඳිය හැකි දෙයක් නොවිණි. අඩුම තරමින් දියුණු මනසකින් හෝ ඒ විඳින්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයක් වෙයි.

© Prof. Nalin De Silva

නාගර්ජුනපාදයන් වහන්සේගෙන් සියවස් හතරකට පමණ පසුව ශංකරාචාර්යවරයන් උපත ලැබුයේ ඒ ප්‍රශ්නය බෞද්ධ භාරතයට අභියෝගයක් වූ වකවානුවක දී ය. එතුමා ද බ්‍රාහ්මණ වාංශිකයෙක් විය. එතුමා ප්‍රවාද ගොඩනැගීමෙහි ශූරයකු වූ බව පැහැදිලි ය. එතුමා එකළ තිබූ දියුණුම දැනුම් පද්ධතිය වූ නාගර්ජුනපාදයන් වහන්සේගේ ශුන්‍යතාවාදය හැදෑරී ය. එතුමා ඒ බොහෝ දුරට පිළිගත්තේ ය. එබැවින් ම එතුමාට වෛදිකයෝ වෙස්වළාගත් බෞද්ධයකු යැයි කීවෝ ය. වෛදිකයන්ට මුල දී එතුමා කී දේ තේරුම්ගැනීමට නොහැකි වන්නට ඇත. එහෙත් එතුමා කෙළේ ඉතා සියුම් ව බුදු දහමට පහරදීම ය. ඒ පහරදීම කෙතරම් දැඩි වී ද යත් භාරතයෙන් බුදු දහම නැති වී යෑමට එය ද එක් හේතුවක් විය.

ශංකරාචාර්යවරයන් කෙළේ එක් අතකින් ගත්කල ශුන්‍යතාව කණපිට හැරවීම ය. ශුන්‍යතාව වෙනුවට උන්වහන්සේ අද්වෛත නිර්ගුන් බ්‍රහ්මන් යන සංකල්පය ඉදිරිපත් කෙළේ ය. ශුන්‍යතාව මෙන් නොව අද්වෛත නිර්ගුන් බ්‍රහ්මන් පවත්නා ප්‍රපංචයකි. අද්වෛත බ්‍රහ්මන් නිර්ගුන් වෙයි. එනම් බ්‍රහ්මන්ට ගුණ නැත. ඉන් අදහස්වන්නේ අප සාමාන්‍යයෙන් අනෙක් ප්‍රපංච දැනගන්නා ආකාරයට බ්‍රහ්මන් දැනගත නොහැකි බව ය. බ්‍රහ්මන් සුදු කළු ගඳ සුවඳ ආදී වශයෙන් දැනගත නො හැකි ය. එමෙන් ම බ්‍රහ්මන් හැරෙන්නට වෙනත් කිසිවක් ද නැත. බ්‍රහ්මන්ට ද්වෛතයක්, දෙවැන්නක්, විකල්පයක් නැත. බ්‍රහ්මන් යමක විරුද්ධය ලෙස දැනගත නො හැකි ය. බ්‍රහ්මන් අද්වෛත ය. එහෙත් බ්‍රහ්මන් දැනගත හැකි ය. ඒ බ්‍රහ්මන් සමග එක්වීමෙන් ය. අපි බ්‍රහ්මන් සමඟ එක් වී සිටිමු. එසේ එක් වී නැත්නම් බ්‍රහ්මන් හැරෙන්නට තවත් වස්තු ද වෙයි. අප බ්‍රහ්මන් සමග එක්වී සිටිය ද අපට ඒ බව නො දැනෙන්නේ මායාව හේතුකොටගෙන ය. අප බ්‍රහ්මන් සමග එකතුවන්නේ ය යන කියමන ද වැරදි බව වැටහිය යුතු ය. ඒ බ්‍රහ්මන්ට බාහිරව කිසිත් තිබිය නොහැකි බැවින් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva